# සන්නසට සුබපැතුම්

පසුගිය දස වසර පුරාවටම සන්සන පුවත්පත නොකඩවා කියවූ රසිකාවියක් ලෙස අද සන්නසේ දසවන සැමරුම් දිනයේ මෙලෙස සටහනක් තැබීමට ලැබීමත් මා ලද භාග්‍යයක්.

මව්බිමේ මුල් දැල් තිබියදී උදුරාගෙන විත් මෙරට පැලකල පැලෑටියක් අතු ඉති දමා මල් එල දරන්නා සේ, මව්බිම හැරදමා අවුත් මෙහි ගොඩනැගෙන අපගේ ජීවිතවලට අපගේ හදවත්වලට මව්බිමේ තෙතමනයත් උණුසුමත් දනවන්නට සමත් වූ අපේම භාෂාවෙන් පෙළ ගැස්වූ සාරවත් ලිපි පෙළත් සන්නස සතුව ඇත.

තත්පර මිනිත්තු සඳහා මුදල් අයකරන සමාජයක තම කාලය, ශ්‍රමය, ධනය වැය කරමින් සන්නස පුවත්පත වැනි සාරවත් සංග්‍රහයක් අප අතට නොමිලේ පත් කිරීමට පසුගිය දස වසර පුරාත්, මින් ඉදිරියටත් කටයුතු කරන කාර්ය මණ්ඩලය ගන්නා සාමූහික වෙහෙස හා එකමුතුකම අගය කල යුතුය.

සන්නස මෙල්බන් ශ්‍රී ලාංකීය සමාජයට විශාල ආලෝකයක් හා අනන්‍යතාවක් ගෙන එන සුන්දර පුවත්පතකි. සුන්දර හදවත් ඇති මිනිසුන් සමූහයකගේ එකතුවෙන් නිමැවෙන අපූර්ව නිර්මාණයකි.

ඉදිරි වසර වලදීත් නොකඩවා ම තව තවත් රසවත්ව, හරවත්ව, ඔපවත්ව, සන්නස සාර සංග්‍රහය අපවෙත ගෙන ඒමට සන්නස කාර්ය මණ්ඩලයට, විශ්ව රංගායතනයේ දෙමාපියන් හා දූ දරුවන්ද එක්කොටගෙන මම මෙසේ සුභාශිංසන කරමි.



**රශිකා කුලසිංහ**
නර්තනාචාරිනී විශ්ව රරංගායතනය



## දස වසරක් සපුරන 'සන්නස'ට සුබ පැතුම්!

### මහාචාර්ය කුසුමා කරුණාරත්න

කවර පුද්ගලයකු තුළ වුවත් සිය උපන් බිම කෙරෙහි ආදරයක්, ගෞරවයක් ඇති වීම ස්වාභාවිකය. දේශාභිමානය, ජාත්‍යාලය, ජාතිකානුරාගය යනාදී නම්වලින් හඳුන්වනු ලැබෙනුයේ ද එම හැඟීම්ය. තම රට වැසියන් ජනිත වූ බිමෙහි වේවා, අන් කවර දෙසක හෝ වේවා ජීවත් වන විට ඔවුන් කෙරෙහි ද අප තුළ ඇති වනුයේ, "අපේම අය" යන හැඟීමකි.

ශ්‍රී ලංකාව හා ඕස්ට්‍රේලියාව, විශේෂයෙන්ම මෙල්බර්න් නගරය ගත් විට ශ්‍රී ලාංකිකයන් උපන් රට මෙන්ම කවර හෝ හේතුවක් හෝ අවශ්‍යතාවක් නිසා සංක්‍රමණය වී ජීවත් වන රට ද මීට අයත් වෙයි. මෙල්බර්න් නගරයට ළඟා වීමට අවස්ථාවක් උදා කරගන්නා ශ්‍රී ලාංකිකයන් එහිදී සිය දේශයේ වැසියන් කෙරෙහි විශේෂ ඇල්මක් හා උනන්දුවක් දැක්වීමට යොමු වනු ඇත. මෙසේ වන්නේ ද "අපේ කම" නිසාමය.

මෙලෙසින් අද මෙල්බර්න් නගරයේ වාසය කරන ශ්‍රී ලාංකික ලේඛකයන්, නිර්මාණ කරුවන් මෙන්ම ව්‍යාපාරිකයන් ද රැසක් එකතු වී "අපේම අය"ගේ දැනුම හා රසාස්වාදය උදෙසා පුවත්පතක් ආරම්භ කොට දස වසරක් පුරාම පවත්වාගෙන යාමට යොමු වී තිබීම ඉහත දැක්වූ ජාතික හැඟීම් ඉස්මතු කරන අවස්ථාවක් ලෙස ද සැලකිය හැකිය.

නම් වශයෙන් සඳහන් කරතොත් ජගත්, අශෝක, සිසිර, රෝහණ ඇතුළු බොහෝ දෙනා සිය දෙසට හා බසට ලැදි පිරිසක් ලෙස දැඩි කැපවීමකින් යුතුව එදා මෙදා තුර 'සන්නස' පුවත්පත පවත්වාගෙන යාම සැබවින්ම ඇගයීමට ලක් විය යුත්තකි. මෙම පුවත්පත සඳහා වසරකට අධික කාලයක් තුළ ලිපි සැපයීමට මා ලද අවස්ථාව ද, නියත වශයෙන්ම මා අගය කරන්නේ 'අපේ කම' හඳුනන 'අපේම අය' වෙනුවෙන් සුළු වශයෙන් හෝ දායකත්වයක් ලබා දීමට එමගින් හැකි වන හෙයිනි. විවිධ කරුණු හා මාතෘකාව යටතේ සම්පාදනය වන ලිපි, වෙනත් නිර්මාණ මෙන්ම මෙල්බර්න් නුවර වෙසෙන ශ්‍රී ලාංකික බාල වැඩිහිටි බොහෝ දෙනාගේ දායකත්වය ද 'සන්නස' පුවත්පතට ලැබීම පමණක් නොව වසර දහයක් තිස්සේ එය ස්ථාවරව පවත්වාගෙන යාමට හැකි වීම ද සැබවින්ම වාසනාවකි.

දෙස් විදෙස්හි 'ශ්‍රී ලංකා' නාමය බැබළවීමට දස වසරක් පුරා 'සන්නස' පුවත්පත දරා ඇති පරිශ්‍රමයට අපගේ සුබ පැතුම් එක් කරන අතරම ඉදිරියටත් ශ්‍රී ලාංකික පාඨකයනට අර්ථවත් මෙහෙයක් ඉටු කිරීමට 'සන්නස'ට හැකි වේවායි පතමි.

## ස්තුතියි

සිංහල කඩයකින් හෝ වෙනත් තැනකින් හෝ නොමිලයේ සිංහල පත්තරයක් අතට ගන්නා විට එය පිටුපස කොයි තරම් ශ්‍රමයක් සහ කැපවීමක් සැඟව තිබුණි දැයි අපි මොහොතකටවත් නොසිතුවෙමු..

දස වසරක් අප වෙනුවෙන් ශ්‍රමය කැප කළ සන්නස හිතවතුනි..
ඔබ සැමට අපේ ප්‍රණාමය මෙසේ පුද කරමු..

**සරත් නන්දකුමාර**
නෝබල් පාක්

එළියක් වෙමින් පන්හිඳට
දුන් නුඹේ ඉඩකඩට
මදි වදන් කිසිවෙකුට
තුතිමල් පුදන්නට........
ලැබෙන හැම සිතුවිල්ලක්ම
පල කළා එලෙසින්ම
ඒ නුඹයි,
"සන්නස".....
ගෙවුන දස වසර තුල
පැමිණි නේක බාදා
බිඳලමින් ආ ගමන
අති විශිෂ්ඨයි...
පතන්නෙමි හදවතින්
සිතුවිලි වලට දුන් ඉඩට
දිගු කලක් වැජඹෙන්න
තවත්
එක් පාඨක සිතුවිල්ලකින්....

සුභ උපන් දිනයක් "සන්නස"...

**තුෂාංගනී මාරඹ**
වේයන්ගොඩ

## "ගඟක් නම් එය ගලා යා යුතු වෙයි"

මාධ්‍යය ට, මාධ්‍යයේ වගකීම මඟෑරෙමින් ඇති මොහොතක, විදේශයක දී මාධ්‍යය වගකීමක් ඉටු කරන්නට සන්නස උත්සාහ දැරීම ම සතුටට කරුණකි. එමෙන් ම තරඟකාරී මාධ්‍යය අතරේ අඛණ්ඩව වසර 10ක කාලයක් තිස්සේ පුවත්පතක් මුද්‍රණය කර බෙදා හැරීම අතිදුෂ්කර කාර්යයක් බව අපි අත්දැකීමෙන් දන්නා දෙයකි. බරපැන සහ ලිපි සපයා ගැනීම විදේශ රටක දී පහසු කාර්යයක් නොවූ මොහොතක සන්නස ආරම්භ වීමත්, පවත්වා ගෙන යෑමත් අපට විශේෂ වන්නේ එබැවිනි.

අන්තර්ජාලයේ බලපෑම මේ මොහොතේ කෙතරම් වුව ද, ලෝකයේ තවත් ජනකොටසකට තමන්ට රිසි දේ, සමාජයීය යහපත වෙනුවෙන් ලියා, සමාජගත කරන්නට ලැබෙන අවස්ථාවත්, පාඨකයාට ඒවා කියවා ගැනීමට ලැබෙන අවස්ථාවත් "ඇගයීම"ට මෙය කදිම අවස්ථාවකැයි සිතමි. එමෙන්ම, තවදුරටත් පාඨකයාගේ නැණස වර්ධනය කරලීමටත්, සමාජ සංවර්ධනයත් උදෙසා එක යායට මිනි සුන් තැනීමේ දායකත්වය සැපයීමට සන්නස ට හැකි වේ වා යි පතමි. විශේෂයෙන් ම මේ ගෙවී යන මොහොත සියලු ශ්‍රී ලාංකිකයි නට තීරණාත්මක මොහොතකි. එහි දී මනුෂ්‍යත්වය සහ බුද්ධිය විනා අන් කිසිවක් වැදගත් නොවන බව සමාජයට ඒත්තු ගැන්වීම ට, සන්නස ට තරමකට හෝ හැකි වන්නේ නම් එය කාටත් එක සේ සතුටු විය හැකි කරුණකි.

සන්නස දසවස් සපුරන මේ මොහොතේ එහි සහෘදයින්ට, විවිධ දුෂ්කරතා හමුවේ වුව ඉදිරියටත් තම මෙහෙවර ඉටු කරන්නට හැකි වේවා යි ප්‍රාර්ථනය කරමි

**තුෂාරි ප්‍රියංගිකා**
ජර්මනිය

මවු බිමෙන් එපිට - දිවි ගෙවන අපට
නෙක විලස දැනුම සහ පහන් සංවේගය මුසුව
පනහින්දෙන් හපන් මවන-සංවේදී සැමට.
පන්නරය උනා නුඹ සන්නස හොඳ අපුරුවට..
අනුන්ගේ දුක දුටුව - පොදු වැඩට අත දුන්න
තෝතැන්න උනා නුඹ පිපාසිත පාඨකයන්ට

කාලයත් වියැකිලා -නුඹ අද මල්වර වෙලා.
මෙතෙක් ආ ඒ ගමන - තවත් ලස්සන වෙලා
පින්බර යුවතියක ලෙස - ගුණ සුවඳ වස්වමින්
බොහෝ පලබර වීයන් - මතු දිනේ මවක ලෙස
යුතු අයුතු කම් හැඳින - නිසි මග නුඹ පානගා
සැබෑ තතු පෙන්වමින් - ලොවේ යහපතම ගැන
සටන් වදිනා සන්නස වෙලා - හිඳින්නට ආසිරි වේවා

**ශිරෝමා ප්‍රනාන්දු**

දානය යනු දීමය. දිය යුත්තේ කිසිදු ලාභපේක්ෂාවකින් තොර පිරිසිඳු සිතිනි. පරිත්‍යාගය යනු එයමය. අවුරුද්දේ දොළොස්මස නොවරදවා පුරා දස වසරක් දානය පිරි නැමීම පහසු කටයුත්තක් නොවේ. දානයෙහි කළමනා පිළියෙල කිරීමටත් වඩා දුෂ්කර කාරිය, එම සද් කාර්යය ඉටු කිරීමෙහිලා අධිෂ්ඨාන සහගතව තිරව පිහිටා නොසැලී සිටීමය.

පැන්සලක් අතට ගෙන කුරුටු ගා පින්සලක් ගෙන පාට - ගාන හැම චිත්‍රයක්ම සිතුවමක් නොවේ. එසේම පිටු ටිකක් එකතු කර ලිපි ටිකක් ඔබ්බවන හැම පත්තරයක්ම පුවත්පතක්ම නොවේ.

ඇතැම් ලේඛකයන් ලියන්නේ තමන් වෙනුවෙනි. ඔවුනට වෙනස්, වෙනත් ලේඛකයන් ලියන්නේ අනුන් වෙනුවෙනි. හෙවත් මමංකාරය හා ආත්මලාභය සඳහා නොව ජනතාව හා මුළු මහත් සමාජයක් වෙනුවෙනි.

මම මෙවන් සටහනක් තැබුවේ ඕස්ට්‍රේලියාවේ පළවන "සන්නස"පුවත්පතේ දසවස් පූර්ණ මංගල්‍යයට සුභ පැතුමක් ලෙසිනි.

සන්නස යනු පිටතින්, අභ්‍යන්තරයෙන් සේම අන්තර්ගතයෙන් ද සැබෑම පුවත්පතකි. භාවපූර්ණ සිතුවමකි. දස වසරක් පුරා නොමිලයේ ලබා දෙන පුවත්පතක් පළකිරීම අති දුෂ්කර ව්‍යායාමයකි. කිසිම වෙහෙසක් වියදමක් නැතිව එය භුක්ති විඳින අප අසෝක, ජගත්, ශ්‍රීනාත් ප්‍රමුඛ සන්නස නිමැවුම්කරුවන්ට කෘතඥ විය යුතුය.

තවත් දස වසරක් යෙහෙන් වැජඹීමට සන්නසට සුභාසිරි !

**රෝහිත මුණසිංහ** ප්‍රංශය

## සන්සන පුවත්පතට අරුත්බර වූ නවමු ලොවකට

## ලක් මැදුර පදනමේ සුභාශිංසන

මෙරට සිංහලෙන් පළවන පුවත්පතක හා අප පදනම අතර බැලූ බැල්මට පැහැදිලි වෙනසක් තිබුණද, දෙකෙහිම පොදු මුඛ්‍ය පරමාර්ථය වනුයේ ශ්‍රී ලාංකික ප්‍රජාවට සේවයක් ඉටු කිරීම බව අපගේ හැඟීමයි.

"යම් සංවිධානයක් හෝ පුවත්පතක් ආරම්භ කිරීම පහසු වුවත් එය අඛණ්ඩව පවත්වාගෙන යාමේදී ඇතිවන බාධක, කම්කටොලු අපවාද, පසුතැවීම් පිළිබඳව අවබෝධයක් ඇතත. ඒ වෙනුවෙන් ඇප කැපවී කටයුතු කරන පුද්ගලයින් පමණි. එවන් තත්වයන් මැද අඛණ්ඩව දස වසරක් සන්නස පවත්වාගෙන යාම ද ශ්‍රී ලාංකික ප්‍රජාව ලද ජයග්‍රහනයකි.

ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකිකයින් හට සිය හැකියාවන් ඉදිරිපත් කරන්නට මග පාදා දෙමින් ද, සිදුවන සෑම සමාජ මෙහෙවරකටම අතහිත දෙමින් ද. සිය පාඨකයින් හට විවිධාකාර ලෙස දැනුම සහ රසාස්වාදය ගෙන දෙමින් ද සන්නස මෙතුවක් කළ මහඟු සේවයට ලක් මැදුර පදනම සිය උපහාරය පිරිනමන අතර, ඉදිරි ගමනේදී ඇතිවන සියළු බාධක ජය ගනිමින් හුදී ජනයාගේ යහපත වෙනුවෙන් ඇප කැප වෙමින් අරුත් බර වූ නවමු ලොවකට සිය පාඨකයින් රැගෙන යන්නට සන්නස පුවත්පත වෙතට ලක්මැදුර පදනම සිය හද පිරි

## සන්නසට වික්ටෝරියාවේ ආදි ආනන්දයීයන්ගෙන් සුභාසිංශන !

2015 අප්‍රේල් මාසය වන විට දස වසරක් සපුරන සන්නස මාසිකය ආ ගමන අපි අගයමු.

දස වසරක් යනු කෙටි කාලයක් නො වේ. විශේෂයෙන් ම විදෙස්ගතව තරඟකාරී වටපිටාවක කාර්ය බහුල ව සිටිනා සංක්‍රමණිකයින් වශයෙන් කාලයට වැඩි වටිනාකමක් ලැබෙයි.

තමන්ට ඉඩ හසර ලැබෙනා පරිදි කාලයත්, ධනයත් මනා සේ කළමණාකරය කරගනිමින් ඕස්ට්‍රේලියාවේ පදිංචි වී සිටිනා ශ්‍රී ලාංකික සම්භවයක් ඇති අප වෙනුවෙන් සමාජ සත්කාරයක යෙදීමට සැදී පැහැදී සිටිනා "සන්නස" ට දසවසරක් පිරීම අප කා හටත් වැදගත් වෙයි.

මව් බිමෙන් මෙහි ගෙන ආ මව් බස මූලික කොටගෙන අප සෑම සියළු දෙනා වෙනුවෙන් කැප වී දැනුම, ප්‍රවෘත්ති බෙදා හදා ගන්නා ලේඛක පෙළ පිළිබඳව ද සිහිපත් කළ යුතුයි. නොයෙකුත් හැකියාවන් පානා ඔවුනට "සන්නස" වේදිකාවක් වූ සේ ය.

සමාජ සත්කාරයෙහි යෙදෙන අනෙකුත් සමාජ සංවිධානවල ක්‍රියාකාරකම් පිළිබඳව පාඨකයින් දැනුවත් කිරීමෙහි ලා "සන්නස" මාසිකය ඇතුළු සියලු මාධ්‍යවල දායකත්වය සුළුපටු නොවේ.

මව්බිමේ කාලීන අවශ්‍යතාවයක් අනුව මීට වසර 130කට පමණ පෙර කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට් තුමාගේ ප්‍රධානත්වයෙන් පිහිටුවාගත් කොළඹ ආනන්ද විද්‍යාලය වෙතින් එදා මෙදා තුර සමාජය වෙත කෙරෙනා උතුම් මෙහෙවරට දායක වීමට පිහිටුවා ගත් සංගමයකි, වික්ටෝරියානු ආදි ආනන්දයීය ...... සංගමය. විටින් විට අප විද්‍යාලය පිළිබඳව වත්, අප සංගමයේ කටයුතු පිළිබඳවත් පාඨකයින් දැනුවත් කිරීම පිළිබඳව ඉතා ඉහළින් අගයන්නේ ස්තූති පූර්වකවයි.

ඉතින් "සන්නස" මාසිකයට අපගෙන් පිදෙන සුභාසිංශනය වන්නේ, චිරාත් කාලයක් මේ සමාජ මෙහෙවර කරගෙන යාමට දිරිය සවිය ලැබේවා ! ය යන්නයි.

**වික්ටෝරියානු ආදී ආනන්දයීයන්ගේ සංගමය**

හේතුව සාධකය කුමක් වුවත් අද අප සැම විප්‍රවාසීව සිටින්නෙමු. ජන්මයෙන් උරුමයෙන් ලද බොහෝ මා හැඟි මව්රටට තබා ඇවිදින් අලුත් වූ වෙනස් වූ බහු සංස්කෘතික පරිසරයක හරිබරි ගැසී ජීවත්වීමට අප දැන් හුරු පුරුදු වෙලාය.

ජාතිවාදය තරයේ ප්‍රතික්ෂේප කරමින් තාක්ෂණික යුගයක විශ්ව වන්දනාවේ යෙදෙමින් කල් ගතකළ ද අපට යම් අඩුවක් ඇති බවට නිදසුනක් වන්නේ සති අන්තයේ අප සැම අත් විඳින දැඩි කාර්යබහුල තත්වයයි. බොහෝ විට සිය පවුලේ කුදු මහත් කටයුතු පවා පසෙක ලා සීතලේ ගැහි ගැහී කුඩා දරුමල්ලන් ද රැගෙන කොතැනක හෝ පොදි ගැසෙමින් අතීතාත්මය නැමැති නොතින් පවස නිවාලන්නට ප්‍රයත්න දරමින් පසුවන්නෙමු.

මෙම පවස සන්තර්පනය කිරීමේ අවශ්‍යතාවය මුලින්ම දැනෙන්ට වූ අවධියකි, එනම්, අදට දස වසරකට පෙර රෝපණය කරන ලද සන්නස නැමැති රුක අද මල් පල දරමින් සශ්‍රිකව වැඩී තිබෙනු දැකීම පවා සුබ ලකුණක්ය. මෙම සාර්ථකත්වය ඉබේ පහළවූවක් නොව බුද්ධිමය ලෝකය පිළිබඳව නිරන්තර විමසිල්ලෙන් පසුවන පාඨක පිරිසට වටිනා යමක් ඉදිරිපත් කිරීම සඳහා සන්නස සංස්කාරක මඩුල්ල නොමඳ අධිෂ්ඨානයෙන් සහ කැපවීමෙන් ක්‍රියා කිරීමේ යහ ප්‍රතිඵලය නිසා බව සඳහන් කළ යුතුමය. එම ගෞරවය ඔවුනට හිමිවිය යුතුය.

බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ හුණුවටයේ කතාව නාට්‍යය සිංහලට නගමින් හෙන්රි ජයසේනයන් මෙසේ සටහන් තබා ඇත.

රියැදුරු මනාවූ
ලැබිය යුතු වූ සේම අස්රිය

තවදුරටත් මේ සමාජ මෙහෙවරෙහි නියැළීම සඳහා ඔවුනට ශක්තිය ධෛර්ය පතමින්, මේ සොඳුරු මොහොතේ සන්නස පුවත්පතට මගේ උණුසුම් සුබ පැතුම් පිරිනමන්නේ හද පිරි සොම්නසිනි.

**ස්වර්ණකාන්ති රාජපක්ෂ** ප්‍රවීණ ලේඛිකා